මහාපරිපාලක ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - දේවහුව
வதிவிட திட்ட முகாமையாளர் காரியாலயம் - தேவகுவ
Resident Project Management Office - Dewahuwa

වාරිමාර්ග කළමනාකරණ අංශය
நீர்ப்பாசன முகமைத்துவ பிரிவு
Irrigation Management Division
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
Ministry of Irrigation & Water Resources Management

RPM-0718101553
Office-0662287425

දේවහුව
தேவகுவ
Dewahuwa

මගේ අංකය / எனது இல. / My Ref No: 3/3/7
ඔබේ අංකය / உமது இல. / Your Ref No:
දිනය / திகதி / Date: 2017.03.28

දිස්ත්‍රික් ලේකම් ,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
මාතලේ.

**විශේෂ ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම (පෙර කන්න රැස්වීම) -2017.03.21**
**2017 යල කන්නය - දේවහුව ව්‍යාපාරය.**

1994 අංක 13 දරණ වාරිමාර්ග(සංශෝධන) පනතේ 5 වන වගන්තියේ 5 වන අනු වගන්තිය අනුව 2017/03./21 දින දේවහුව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ දී පැවති පෙර වගා රැස්වීමේදී–දේවහුව මහා වාරිමාර්ග ව්‍යාපාරයේ 2017 යල කන්නය සඳහා යෝජිත වගා කාල සටහන හා පොදු තීරණ පහත දැක්වේ.

- වගා රැස්වීම සඳහා යෝජිත දිනය : 2017.03.30
- වගා කිරීමට යෝජිත බිම් ප්‍රමාණය: අක් 3000
- වගා කිරීමට අපේක්ෂිත බෝග වර්ග- වී මාස 3 3 ½ 70% සහ අතිරේක බෝග 30% දුම්කොළ හැර
- බිම් සැකසීම ආරම්භ කිරීමට යෝජිත දිනය - වර්ෂාව සමග
- මුල් ජලය නිකුත් කිරීමට යෝජිත දිනය - අප්‍රේල් 17-20ත් අතර
- ඇලවේලි ශුද්ධ කර අවසන් කිරීමට යෝජිත දිනට -අප්‍රේල් 10 ට පෙර
- නඩත්තු සඳහා ගොවි සංවිධාන විසින් අයකළ යුතු මුදල - ගොවිසංවිධාන තීරණ පරිදි
- බීජ වපුරා පැළ සිටුවා අවසන් කිරීමට යෝජිත දිනය - මැයි 07 ට පෙර
- වගාව රක්ෂණය කර අවසන් කලයුතු දිනය- මැයි 07
- ට්‍රැක්ටර් හා උපකරණ යායෙන් ඉවත් කල යුතු දිනය- මැයි 07
- මුර ජලය ආරම්භ කිරීමට යෝජිත දිනය - මැයි 10 ට පෙර
- ජල මුර ක්‍රමය - දින 8කට වරක්
- අවසාන වරට ජලය නිකුත් කර සොරොව්ව වසා තැබීමට යෝජිත දිනය- අගෝ 10
- අස්වනු නෙලන අවසාන දිනය- අගෝස්තු 30
- ඇලවේලි ශුද්ධ නොකිරීමේ දඩය-බඹයට රු500/=

- වගා හානි දැනුම් දිය යුතු අවසාන දිනය- අස්වනු නෙලීමට පෙර
- අයාලේ යන ගවයින් ගෙන් වන හානිය සඳහා අයකලයුතු මුදල- හානි තක්සේරු අනුව ගොවි සංවිධාන විසින් හානිය අයකෙරේ.
- වාරිමාර්ග නිර්මිත /රක්ෂිතවලට හානි කිරීම වෙනුවෙන් යෝජිත දඩ මුදල -පොදු දේපල හානි කිරීමේ නීති යටතේ වාරිමාර්ග ඉංජිනේරු විසින් නීති ක්‍රියාමාර්ග කිරීම

*වගා නොකලයුතු බෝග දුම්කොළ හා ගර්කින් වේ.

+<u>පොදු තීරණ</u>

-සෑම ගොවි සංවිධානයකින්ම 30% ක බිම් ප්‍රමාණයක් අතිරේක බෝග වගාවට ඉඩම් වෙන් කිරීම හා එම වෙන්කළ ඉඩම් අයත් ඇළවල් සඳහන් කර ගොවින්ගේ නාම ලේඛණයක් සකසා ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට හා වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයට ලබාදීම.

-අවශ්‍යතාවය අනුව ඉඩම් වෙන්කිරීම පරීක්ෂා කිරීම සඳහා කමිටුවක් පත් කිරීම සුදුසු බවට තීරණය විය.

-හැකිතාක් වර්ෂාව මගින් බිම් සැකසීම හා කැකුලමට සී සෑමට ගොවින් උනන්දු කිරීමට ගොවි සංවිධාන මැදිහත්වීම.

-අතිරේක ජල මුර ලබා නොගැනීම හා කන්න රැස්වීමේ දින වකවානුවලට වගා කිරීමටත් උපරිම ජල කළමනාකරණයක් සඳහා ගොවින්ගේ සහයෝගය ලබාදීමට එකඟ විය.

මෙම තීරණ යෝජනා කිරීම. ස්ථිර කිරීම.

යාය 03 සභාපති,ඒ.පී.ගුණදාස මහතා යාය 5 භාණ්ඩාගාරික කේ.ජී.හිංබණ්ඩා

පී.ඒ.ප්‍රේමසිරි
නේවාසික ව්‍යාපාර කළමනාකරු
වාරිමාර්ග කළමනාකරණ අංශය
දේවහුව.

පී.ඒ.ප්‍රේමසිරි,
නේවාසික ව්‍යාපාර කළමනාකරු,
දේවහුව.

පිටපත් -

1. අධ්‍යක්ෂ,වාරිමාර්ග කළමනාකරණ අංශය.කොළඹ - කා.දැ.පි
2. අධ්‍යක්ෂ,වාරිමාර්ග දෙපාර්තමේන්තුව,මහනුවර - කා.දැ.පි
3. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ,අන්තර්පළාත්/පළාත් අනුරාධපුරය/මාතලේ - කා.දැ.පි.
4. සහකාර ගොවිජන සේවා කොමසාරිස්,අනුරාධපුරය/මාතලේ - කා.දැ.පි
5. ප්‍රාදේශීය ලේකම්,ගලේවෙල/පලාගල - කා.දැ.පි
6. වාරිමාර්ග ඉංජිනේරු,දඹුල්ල - කා.දැ.පි